රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 33/95

මගේ අංකය: I/543ඊ02ඞී/02/94 (ii)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

1995 නොවැම්බර් 14 දින

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා ඉවත් කිරීම</u>

1994.07.25 දිනැති අංක 27/94, 1994.07.25 දිනැති 27/94 (I), 1994.08.08 දිනැති අංක 29/94, 1995.03.20 දිනැති අංක 29/94 (I), 1995.04.07 දිනැති අංක 29/94 (II), 1995.06.20 දිනැති අංක 29/94 (III) හා 1995.04.28 දිනැති අංක 14/95 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් ඇතැම් සේවාවන්ට අදාල වැටුප් පරිමාණයන් සංශෝධනය කරන ලදී. එම නිසා එම වැටුප් පරිමාණයන් අදාල වූ ඊට සමාන්තර සමහර දෙපාර්තමේන්තුගත තනතුරුවල වැටුප් පරිමාණයන් සම්බන්ධයෙන් විෂමතාවන් ඇති වී තිබේ.

02. එම විෂමතාවන් ඉවත් කිරීම සඳහා මෙම චක්‍රලේඛයට යාකර ඇති ඇමුණුම I හි සඳහන් පරිදි වැටුප් පරිමාණයක් සංශෝධනය කිරීමටත්, එම සංශෝධනයන් 1995.11.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත් රජය තීරණය කර ඇත.

03. මෙම සංශෝධනය පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් වැටුප් සංශෝධිත වූ සේවාවන්ට අදල නොවේ.

(I) 1994.07.25 දිනැති අංක 27/94
(II) 1994.08.08 දිනැති අංක 29/94
(III) 1995.02.06 දිනැති අංක 3/95

04. ශ්‍රී ලංකා ගුරු සේවය සම්බන්ධයෙන් ද මෙම සංශෝධන අදල නොවේ.

05. දැනට පවතින වැටුප්වලින් නව වැටුප්වලට පරිවර්තනය කරනුයේ පියවරෙන් පියවරට තැබීමේ පදනම අනුවය.

06. දැනට පවතින වැටුප් වර්ධක දින නොවෙනස්ව පවතිනු ඇත.

07. 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැටුප් පරිමාණයන් යටතේ නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම ඊට අදාල නව වැටුප් පරිමාණයන්හි අනුරූපී පියවරේදී ක්‍රියාත්මක වනු ඇත.

08. මෙම චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය නොසලකා 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි මාණ්ඩලික නිලධාරියා හෝ යටත් නිලධාරියා හෝ කණිෂ්ඨ සේවකයා යන නිර්වචනය යටතේ නිලධාරියාගේ වර්තමාන තත්ත්වය තවදුරටත් උපදෙස් නිකුත් කරන තෙක් නොවෙනස්ව පවතිනු ඇත.

09. මෙම චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය නොසලකා තවදුරටත් උපදෙස් නිකුත් කරන තෙක් සංයුක්ත දීමනා සහ දුම්රිය බලපත්‍ර හිමිකම 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ නියම කර ඇති පදනම මත විය යුතුය.

10. නිලධාරියාගේ නව වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කිරීම ද 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිශතයන්ට අනුව සිදුවිය යුතුය.

11. සංශෝධනය කරන ලද වැටුප් ගෙවිය යුත්තේ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවලට 1995 අයවැය ප්‍රතිපාදන මගින් සලස්වා ඇති පුනරාවර්තන ප්‍රතිපාදනවලිනි. අතිරේක අරමුදල් අවශ්‍ය වන්නේ නම් එවැනි අතිරේක අරමුදල් ප්‍රමාණය ගණන් බලන ලද ආකාරය පැහැදිලි කරමින් ඉල්ලුම්පත්‍රයක් මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය. මෙම වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් ඉතුරුවීම් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වැය ශීර්ෂවල තිබෙන බව තහවුරු වනතුරු හෝ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වෙන් කිරීමක් ලබා ගන්නා තුරු භර කිරීම් නොකල යුතුය. අතිරික්තයන් ආවරණය කර ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙන් කිරීම් කරනු නොබලන බැව් පැහැදිලිව සටහන් කරගත යුතුය.

12. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය